විමර්ශී 29

## ඇස් කන් නැති මාධ්‍ය

එක්සත් ජාතීන්ගේ මානුෂවාදී (Humanitarian Day) දිනය යෙදී ඇත්තේ අගෝස්තු මස 19 වැනිදාටය. එක්සත් ජාතීන් විසින් ප්‍රථම වරට එම දිනය නිල වශයෙන් සමරණු ලද්දේ පසුගිය බදාදා එනම්, 2009 අගෝස්තු මස 18 වැනිදාය. එම සැමරුම සිදු කරන අවස්ථාව වන විට ශ්‍රී ලාංකික ඉතිහාසයේ මිනිසා විසින් නිර්මාණය කරන ලද ව්‍යසනයකට ගොදුරු වූ දැවැන්තම අවතැන් ජනතාවක් මානුෂවාදී අවශ්‍යතා මෙන්ම මානව හිමිකම් අහිමි වීමෙන්ද දැඩි සේ පීඩා විඳින බව ශ්‍රී ලංකා වාසීන් දන්නා බවක් නොපෙනේ. එක්කෝ දනිතත් නොදන්නා සේ සිටිති. එක්කෝ දැනෙතත් තමන්ගේ නොවේයැයි සිටිති. එක්කෝ දකින්නට ඇස් නැති නිසා, අසන්නට කන් නැති නිසා අසංවේදීව සිටිති. රටක ජනතාවට දකින්නට ඇස්, අසන්නට කන් ලබා දෙන්නේ ජනමාධ්‍ය විසින් ලබා දෙන තොරතුරු ඔස්සේය. ජනමාධ්‍ය මගින් ඒ වගකීම ඉටු වන්නේ නැතිනම්, ජනමාධ්‍යයට ඒ වගකීම ඉටු කරන්නට බාධා ඇත්තේ නම් ජනමාධ්‍ය සතු ප්‍රථම යුතුකම වූ ජනතාවට පක්ෂපාතී වීම සිදු වන්නේ නැත. ජනමාධ්‍යයට පක්ෂපාතී නොවන, ජනතාව වෙනුවෙන් කටයුතු නොකරණ මාධ්‍යයකින් රටකට පළක් වන්නේද නැත.

කෙසේ නමුත් ජනමාධ්‍ය සතු එම සමාජ වගකීම ඉටු කරන ආකාරය නිරීක්ෂණය කරමින් අප ලියූ ප්‍රථම තීරු ලිපිය යළි විමසා බලන්නට හැකි තත්ත්වයක් අදත් උතුරේ අවතැන් ජනතාවට උදාවී ඇත. එම තීරු ලිපියෙන් අපට කතා කරන්නට සිදු වූයේ යුද්ධය නිසා කඳවුරෙන් කඳවුරට යළි යළිත් අවතැන් වෙමින් සිටි වන්නියේ ජනතාවට මහ වැසි නිසා කර කියා ගන්නට දෙයක් නොමැති තත්ත්වයට පත් වූ ආකාරයයි. විශේෂයෙන් එහිදී අපගේ අවධානයට ලක් වූයේ, දෙමළ පුවත්පත් හැර අනෙකුත් කිසිදු මාධ්‍යයක් ගංවතුරෙන් කඳවුරු යට වීමෙන් හා යුද ගැටුම් නිසා යන්නට අතක් නැති වීමෙන් විපතට පත් ජනතාව ගැන කිසිවක් වාර්තා නොකිරීමයි. සතියකට පමණ පසු දකුණේ ප්‍රදේශවලට ගංවතුර බලපාන විට විශාල පුවත් ලෙස ඒවා වාර්තා කළ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යවලට උතුරේ ගංවතුර ගැන වාර්තා කරන්නට තිබුණේ කරවටක් ජලයේ සිට යුද මෙහෙයුම්වලට සූදානම් වන හමුදා ගැන පමණි. අප එම ලිපියේ සිරස්තලය යෙදුවේ **''දකුණේ අපට නොපෙනුන උතුරේ ගංවතුර''** යනුවෙනි. පසුගිය සිකුරාදා (14) වන විට ජලයෙන් යටවූ වව්නියාවේ අවතැන් කඳවුරුවල ජනතාව මුහුණ දුන් තත්ත්වය ගැන මේ රටේ මාධ්‍ය වාර්තා කර ඇති ආකාරය නිරීක්ෂණය කරන විට පසුගිය ඔක්තෝබර් මාසයේ අග අප විසින් ලියන ලද තීරු ලිපියට යොදන ලද සිරස්තලයටම ගැලපෙන මාධ්‍ය හැසිරීමක් දක්නට ලැබීම ගැන සටහන් කරන්නට සිදු වී ඇත්තේ එදාටද වඩා කණගාටුවෙනි.

එදා යුද්ධය පැවැති යුද කළාපය තුළ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම නිසා වාර්තා නොකළ බව කෙනෙකුට සාධාරණීකරණය කළ හැකිව තිබිණි. නමුත් දෙමළ පුවත්පත් හා වෙබ් අඩවි ඡායාරූප සහිතව වාර්තා කර තිබිණ. එම මූලාශ්‍ර හෝ ඡායාරූප අනෙකුත් මාධ්‍යවලට නොතිබුණේද? කෙසේ හෝ එය යුද්ධයේ ගිණුමට බැර කළ හැකි වුවත් අද යුද්ධය අවසන්ය. තම ගම් බිම්, හරිහම්බ කර ගත් වස්තුව, දරුවන්, සැමියන්, බිරියන්, දෙමාපියන්, ඥාතීන් එක් එක් ආකාරවලට අහිමි කර ගෙන අද එම ජනතාව ලෝකයේ දැවැන්තම එළිමහන් සිර කඳවුර ලෙස විරුදාවලි ලැබූ අවතැන් කඳවුරක සිරවී සිටිති. ඒ සිටින්නේද එදා යුද්ධය පැවැති වන්නියෙන් මෙපිට වව්නියාව දිස්ත්‍රික්කයේය. පසුගිය දා ඇදහැලුනු අහඹු මහ වැස්සෙන් ඔවුන් විපතට පත් වන විට සිටියේ බොහෝ මානුෂවාදී අවශ්‍යතා ඉටු නොවුණු, නිදහසේ ගමන් බිමන් යෑමේ, පවුලක් ලෙස එකට ජීවත් වීමේ අයිතිය ආදී මූලික අයිතිවාසිකම් සියල්ල අහිමි වූ පසුබිමකය. මෙම මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් අභියෝගයට ලක් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වීමට ඇත. ඒ අතර යුද්ධයෙන් පසු ඔවුන්ගේ ගැටළු ගැන වාර්තා වූ ඉතා සුළු තොරතුරු අනුවද අවතැන් වූ ලක්ෂ තුනක පමණ ජනතාවට වැසිකිලි පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් වූයේ නැත. 5 දෙනෙකුට පමණ යන්තමින් සෑහෙන කුඩාරම්වල 15ක් 20ක් පමණ ජීවත් වූහ. ජලය, ආහාර, ඇඳුම් සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් වූයේ නැත. මෙවැනි කරුණු සම්බන්ධයෙන් දෙමළ පුවත්පත් විශේෂයෙනුත්, ඉංග්‍රීසි මාධ්‍ය තරමක් දුරටත්, සිංහල මාධ්‍ය ඉතාම සුළු වශයෙනුත් වාර්තා කිරීම යුද්ධයෙන් පසු මානුෂීය පුවත් වාර්තාකරණයේ සුළු සාධනීය ප්‍රවණතාවක් ලෙස අපට හඳුනා ගන්නට ලැබිණ. එසේ

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

තිබියදී ඇද හැලුනු මහ වැසි නිසා කඳවුරු යට කර ගෙන ගලා ආ ගං වතුරත්, ඒවාට මුසු වූ උතුරා ගිය වැසිකිලි වලවල අපද්‍රව්‍යත් නිසා එම ජනතාව ගිලිණේ තමන්ගේ අසූචි මිශ්‍ර වූ වතුරේය. එසේ තමන්ගේම අසූචි ගොඩේ සිටින්නට සිදු වූයේ යන්නට අතක් නැතිව සිටි ජනතාවක් නොවේ. භාර ගන්නට ඥාති හිත මිත්‍රාදීන් නොමැති ජනතාවක් නොවේ. රජය විසින් එම මූලික අයිතීන් උල්ලංඝණය කරමින් යුද්ධය අවසන්ව මාස තුනක් පිරී තිබියදීත් සිර කර ගෙන සිටින ජනතාවකි. එම මානව ඛේදවාචකය ගැන හඬගා කියන්නට අපේ රටේ මාධ්‍යයට තව දුරටත් තොරතුරු සොයා ගැනීම කළ නොහැකියැයි කිව හැකිද?

කඳවුරු ගංවතුරෙන් යටවූ 14 වැනිදාට පසුව, දින දෙකක් තුළ මේ රටේ මාධ්‍ය ඒ ගැන වාර්තා කළේ කෙසේදැයි නිරීක්ෂණය කරන කෙනෙකුට එම ජනතාව සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමේ ගැටළුව තව දුරටත් වලංගු වේ යැයි සිතිය නොහැකිය. ඉහත කී තත්ත්වයට ජනතාව පත් වූ ආකාරය මෙන්ම රජය විසින් ලබා දුන් විසඳුම් ගැන බලධාරීන් කළ ප්‍රකාශද ඇතුළත් පුවත් කිහිපය බැගින් (පුවත් 18ක් පමණ) දෙමළ පුවත්පත් (රජයේ පුවත්පත හැර) වාර්තා කර තිබිණ. ඒ අතර ප්‍රධාන සිරස්තල 4ක් සහ කතුවැකියක්ද විය. ඉදිරියේ එන මෝසං වැසි සමයට පෙර මෙම ජනතාව නිදහස් කරන ලෙසට කළ ඉල්ලීම් කිහිපයක්ද දෙමළ පුවත්පත් වාර්තා අතර විය. ප්‍රධාන සිරස්තල සමඟ විශාල වර්ණ ඡායාරූපද පළ කර තිබිණ. තොරතුරු ලබා ගැනීමේ ගැටළුව වලංගු නැති බව මෙම ඡායාරූප නිරීක්ෂණයෙන්ද පැහැදිලිය. ප්‍රධාන ධාරාවේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයට වෙනස්ව, වඩා පැහැදිලිව මෙම මානව ඛේදවාචකය ගැන වාර්තා කර තිබුණේ වෙබ් අඩවි කිහිපයකි. දෙමළ පුවත්පත්වල මෙන්ම මෙම වෙබ් අඩවිවල පළවූ ඡායාරූප සමානය. කෙසේ හෝ එකම මූලාශ්‍රයකින් ඒවා ලැබී ඇති බව හෝ එම මූලාශ්‍රයෙන් ලබා ගෙන වෙබ් අඩවියක් පළ කළ ඡායාරූප අවශ්‍යතාව ගැන සංවේදී අනෙකුත් මාධ්‍ය පාවිච්චි කරන්නට ඇතැයි සිතිය හැකිය. කෙසේ වුවත් ලක්බිම නිවුස් හා සන්ඩේ ලීඩර් ඉංග්‍රීසි පුවත්පත් දෙක ප්‍රධාන සිරස්තල මෙම පුවත සඳහා වෙන් කර තිබීම හා කරුණු සහිතව වාර්තා කිරීම විශේෂයෙන් කැපී පෙනෙයි. තවත් පුවත් කිහිපයක් දක්නට ලැබුණු අතර බහුතරය වූ සිංහල පාඨක ප්‍රජාව වෙනුවෙන් වූ සිංහල පුවත්පත් වාර්තාකරණය ඉතා කුඩා වාර්තා 5කට සීමා වී තිබීමෙන් වාර්තාකරණයෙන් පරස්පරය කැපී පෙනෙයි. එක් සිංහල පුවත්පත් දැක තිබුණේ එම වැස්ස මඩු උළෙලට ආසිරි වැස්සක් වූ බව පමණි. ඊට අමතරව දකුණේ ප්‍රදේශවලට එම වැස්ස ඇදහැලීමෙන් ප්‍රදේශ කිහිපයකට ගංවතුර තත්ත්වයක් ඇති වූ බව වාර්තා කරන්නට වැඩි වාර ගණනක් හා ඡායාරූප කිහිපයක්ද යොදා ගෙන තිබිණ. යුද්ධයට පසු වාර්තාකරණය මෙතරම්ම පරස්පතරයක් පෙන්වීම මෙන්ම සමස්තයක් ලෙස ප්‍රශ්නයේ ගැඹුරේ තරමට වාර්තාකරණයේ ප්‍රමුඛතාවය අඩු වීම එදාට වඩා අදට කණගාටු හිතෙන තත්ත්වයකි.

අවතැන් ජනතාව සම්බන්ධයෙන් බහුතරය නැසූ කන්ව, නොදකින ඇස් ඇතිව සිටින්නේ වාර්තාකරණයේ මෙම පරස්පරතාවයන් හා අඩු ප්‍රමුඛතාවන් නිසා විය හැකිය. මෙම දැවැන්ත මානුෂවාදී ඛේදවාචකය සම්බන්ධයෙන් අවධානය යොමු කොට ඔවුන්ගේ දුක් ගැනවිලිවලට විසඳුම් ලබා දීම සඳහා මඟ පෙන්වීමේ ජනමාධ්‍ය මෙහෙවර තව දුරටත් නිසියාකාරය සිදු නොවුණ හොත් ලක්ෂ තුනක් වූ අවතැන් ජනයාගේ තත්ත්වය දිනෙන් දින නගා සිටු වීම වෙනුවට ඛේදවාචකයක් දක්වා යනු ඇතැයි සිතට දැනෙන්නේ තද බියකි.

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com